**TECHNICAL SESSION I**

# රුහුණ විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක හවතුන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට බලපෑ හේතු අධ්‍යයනය කිරීම සහ ඒවා පාලනය කර ගැනීමට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනයක්

**එච්.ජී.එන්. දේවිකා, පී.ඒ.පී. රේණුක[1], රංජිත් සේනාරත්න[2].**
[1] ආයතන අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය
[2] උපකුලපති කාර්යාලය, රුහුණ විශ්වවිද්‍යාලය.

## සාරාංශය

*රුහුණ විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 781 කි. එහි දෛනික ශ්‍රම පැය ප්‍රමාණය 6248 ක් පමණ වේ. සේවකයින් සේවයට නොපැමිණීම හේතු කොට ගෙන දෛනිකව ශ්‍රම පැය 500 ක් පමණ අහිමි වේ. මෙය ආයතනයේ කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට ද සෘජුව බලපාන අතර සේවකයින් අධික ලෙස නිවාඩු ලබා ගැනීම නිසා අතිකාල සඳහා අධික වියදමක් දැරීමට සිදු වේ.*
*රුහුණ විශ්වවිද්‍යාලයේ පසුගිය වසර 06 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගත් සේවකයින් සංඛ්‍යාව මුළු සේවක සංඛ්‍යාවෙන් 18% (144) කි. මෙම 18% තුල සෑම වර්ෂයකම වැටුප් රහිත නිවාඩු ලබා ගත් සේවකයින් 2.7% ක් විය. මෙය තනතුරු අනුව වර්ග කළ විට ලිපිකරු හා සම ශ්‍රේණි 9% ක් ද කාර්මික ශ්‍රේණි 6% ක් ද කණිෂ්ඨ ශ්‍රේණි 76% ක් ද ආරක්ෂක අංශය 29% ක් හා රියදුරු 2% ක් ද විය. වැටුප් රහිත නිවාඩු ලබා ගත් සේවකයින්ගෙන් 87% ක් පුරුෂ ද, 13% ක් ස්ත්‍රී ද විය. සේවකයින් 37% ක් වෛද්‍ය පීඨයේ ද, 26% ක් පරිපාලන සංකීර්ණයේ ද, 16% ක් කෘෂි පීඨයේද විය. වයස් කාණ්ඩ වශයෙන් ගත් කළ අවු 50-60 ත් අතර 27% ක් ද, 41-50 ත් අතර 39% ක් ද, 31-40 ත් අතර 27% ක් හා 20-30 ත් අතර 7% ක් ද විය. තමාගේ හා පවුලේ සෞඛ්‍ය ගැටළු, වෙනත් පවුලේ ගැටළු, රැකියා ස්ථානයට ඇති නොකැමැත්ත, දුර හා ආර්ථික ගැටළු යන හේතු නිසා ද, පුහුණු ශ්‍රේණිවලට අයත් සේවකයන් මුදල් ඉපයීම සඳහා යොමු වීම නිසා ද වැටුප් රහිත නිවාඩු ලබාගැනීමට හේතුවන බව අධ්‍යයනයේදී පෙනී ගියේය. මෙම නිවාඩු අවම කිරීම සම්බන්ධව නිර්දේශ හා ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම මෙම අධ්‍යනයේ මූලික පරමාර්ථය විය.*
**Keywords :** වැටුප් රහිත නිවාඩු, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, කාර්යක්ෂමතාවය, ඵලදායිතාව

## හැඳින්වීම.

රුහුණ විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අධික ලෙස නිවාඩු ලබා ගැනීම සහ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාල පරිපාලනය ගැටළු රාශියකට මුහුණ දී ඇති අතර එය ආයතනයේ කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයටද සෘජුවම බලපා ඇත.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට උසස් අධ්‍යාපනය වෙනුවෙන් වැය කළ හැක්කේ සීමිත මුදල් ප්‍රමාණයකි. එහිදී අඩු පිරිවැයකින් රටේ සංවර්ධනයට අවශ්‍ය වන අන්දමේ උපාධිධාරියෙකු බිහි කළ යුතුය.

රුහුණ විශ්වවිද්‍යාලයේ 781 ක් පමණ වූ අනධ්‍යයන සේවකයින්ගෙන් බහුතරයක් නිවාඩු ලබාගැනීම හේතුකොට ගෙන දිනකට දෛනික ශ්‍රම පැය 500 ක් පමණ විශ්වවිද්‍යාලයට අහිමි වීමක් සිදුවේ. මේ සඳහා උදාහරණයක් ලෙස ආරක්ෂක අංශ සේවකයෙකු එක් දිනක් නිවාඩු ලබාගත් විට වෙනත් සේවකයෙකුට ඒ සඳහා පැය 8 ක අතිකාල සේවයේ යෙදීමට සිදු වෙයි. මෙම අධ්‍යයනයේදී හෙළි වූ කරුණු අනුව පසුගිය වසර 5 තුළ ආරක්ෂක අංශ සේවකයින් ලබාගත් වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය දින 2000 ක් පමණ වන අතර, ඒ තුළින් විශ්වවිද්‍යාලයට දළ වශයෙන් මාසිකව රු.16,000 ක් පමණ මුදලක් අතිකාල වශයෙන් වැය කිරීමට සිදු වී ඇත.

එමෙන්ම මෙම තත්වය ශිෂ්‍ය අධ්‍යයන කටයුතු කෙරෙහිද සෘජුව හෝ වක්‍රාකාරයෙන් බලපෑම් ඇති කරන අතර අධ්‍යයන වැඩ සටහන් නියමිත දිනට අවසන් කිරීමේදීද බාධා මතු වේ. නමුත් පෞද්ගලික අංශයේ නම් වැටුප් රහිත නිවාඩු ලබාගැනිම බොහෝ විට සිදුකරන්නේ හදිසි රෝගී තත්වයකදී බව අධ්‍යයනයේදී හෙළිදරව් විය. පෞද්ගලික අංශය හා තරඟකාරී අධ්‍යාපන

ක්‍රමයකට මුහුණ දී ඇති රජයේ විශ්වවිද්‍යාල එම අභියෝග ජය ගැනීම සඳහා වඩා කාර්යක්‍ෂම සේවාවක් කාර්ය මණ්ඩලයෙන් ලබාගැනීම අත්‍යවශ්‍ය බව මෙහිදී අවධාරණය කෙරේ.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම අධ්‍යයනයේ අපේක්ෂිත අරමුණු වූයේ,

1. අනධ්‍යයන සේවකයන් ලබාගන්නා වැටුප් රහිත නිවාඩු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.
2. එසේ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට හේතු සොයා බැලීම.
3. කාර්ය මණ්ඩලයේ වැටුප් රහිත නිවාඩු ලබාගැනීම අවම කිරීම සඳහා විසඳුම් සහ යෝජනා ඉදිරිපත් කිරීම.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යනය සඳහා 2000 සිට 2005 වර්ෂය තුළ රුහුණ විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන සේවකයින් ලබා ගන්නා ලද නිවාඩු පිළිබඳ දත්ත යොදා ගන්නා ලදී. ප්‍රථමයෙන්ම මේ සඳහා අධ්‍යයන ආයතනයේ පවත්නා ලිපි ගොනු වලින් හා සංඛ්‍යා ලේඛන වලින් නිවැරදි තොරතුරු ලබා ගන්නා ලදී. ඒ සඳහා ඒ ඒ වර්ෂ වල වාර්ෂික වාර්තා ද උපයෝගී කර ගන්නා ලදී. මේ අනුව 2000-2005 වර්ෂය දක්වා වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයින් 144 දෙනෙකු සිටි බවට තොරතුරු ලබාගත හැකි විය. එහිදී සේවක සංඛ්‍යාව, ලබාගත් වැටුප් රහිත නිවාඩු ගණන, පීඨය, වයස ආදී දත්ත නිවැරදි ආකාරයෙන් පුද්ගලික ලිපි ගොනු ආශ්‍රයෙන් ලබාගත හැකි විය.

ඉන්පසු 2005 හා 2006 වර්ෂ 02 වෙනම ගෙන එම වර්ෂ 02 තුල වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයන් 52 ක් හා 2006.06.30 දින වන විට නිවාඩු 75 ට වඩා ලබාගෙන තිබූ සේවකයින්ගේ නියදියක් ලබාගෙන ප්‍රශ්නාවලියක් ලබාදී තොරතුරු ලබාගන්නා ලදී. එම ප්‍රශ්නාවලියට ලබාදී ඇති පිළිතුරු පරිගණක ගත කොට විශ්ලේෂණය කිරීම මඟින් වැටුප් රහිත නිවාඩු ලබාගැනීමට බලපාන හේතු අධ්‍යනය කිරීමට හැකිය.

ඊට අමතරව 2005 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයන් සමඟ සාකච්ජා කිරීම මඟින් අධ්‍යනයට අවශ්‍ය තොරතුරු තවදුරටත් එක් රැස් කරගන්නා ලදී. එසේ පුද්ගලිකව සාකච්ජා කිරීම මගින් වැටුප් රහිත නිවාඩු ලබාගැනීම පිළිබඳව ප්‍රශ්නාවලියට පිළිතුරු ලබා දීමේදී හෙලි නොවුන කරුණු පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.


ඉන්පසු කොළඹ, කැළණිය, ජයවර්ධනපුර, මොරටුව හා සබරගමුව යන විශ්වවිද්‍යාල වලින් ඒ ඒ විශ්වවිද්‍යාල වල වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා ලද සේවක සංඛ්‍යාව ගෙන්වා ගන්නා අතර එමගින් විශ්වවිද්‍යාල පද්ධතිය තුල වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා ආකාරය පිළිබදව අවබෝධයක් ලබා ගත හැකි විය.

**අධ්‍යයනයේ ප්‍රතිඵල**

අධ්‍යයනයේදී හෙළි වූ කරුණු අනුව මෙම විශ්වවිද්‍යාලය තුළ පසුගිය වසර 06 තුළ වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයින් 144 දෙනෙකු ඇති අතර, එය මුළු සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 18% ක් පමණ වේ. සෑම වර්ෂයකම වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයින් 4 දෙනෙකු සිටි අතර, එක් වසරක් තුළ වැටුප් රහිත නිවාඩු දින 100 ඉක්මවා ලබාගත් සේවකයෙකු ද විය.

ප්‍රස්තාර අංක 1 ට අනුව පෙනී යන්නේ 2003 සිට 2005 වර්ෂය වන විට අනධ්‍යයන කාර්ය මණ්ඩලය ලබාගත් වැටුප් රහිත නිවාඩු ප්‍රමාණයේ අඩුවීමකි.


ප්‍රස්තාර අංක 1
එක් එක් වර්ෂයේ ලබාගත් වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය




මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු (2000 - 2005)

ප්‍රස්තාර අංක 02 අනුව වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව 2002 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා අඩු වී ඇත. එය සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2002 වර්ෂයේ 8.4 % ක් ද, 2003 වර්ෂයේ 7.1 % ක් ද, 2004 වර්ෂයේ 5.4 % ක් හා 2005 වර්ෂයේ 4.5 % ක් ලෙස අඩු වී ඇත.

ප්‍රස්තාර අංක 2
වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව





මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු (2000 - 2005)

වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය අඩුකර ගැනීම සඳහා විවිධ පියවර ගෙන තිබූ අතර එහි දී කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම ප්‍රධාන විය. එසේම මෙම කාර්ය පිළිබඳව පාලක සභාව දැනුවත් කොට ලිපි මගින් අංශ ප්‍රධානීන් ද දැනුවත් කරන ලදි. එමගින් තම අංශවල වැඩිපුර නිවාඩු ලබා ගන්නා සේවකයින් පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් වූ අතර ඒ නිසා අංශවල නිවැරදි නිවාඩු ලේඛන පවත්වා ගෙන යාම නිසා තමන් ලබා ගන්නා ලද නිවාඩු ප්‍රමාණය පිළිබඳව සේවකයින් දැනුවත් වීම මගින් ද වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා ප්‍රමාණය අඩු වූ බව පර්යේෂණයේදී ඔප්පු විය.

ප්‍රස්තාර අංක 03 යටතේ නිවාඩු ලබා අනධ්‍යයන සේවක සංඛ්‍යාව විස්තර කෙරේ.


**ප්‍රස්තාර අංක 03**
**තනතුර හා නිවාඩු**




මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු(2000 - 2005)

ප්‍රස්තාර අංක 03 ව්‍යුහාත්මකව ගත් කළ පසුගිය වසර 06 තුළ නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව 144 ක් වන අතර, 9% ක් ලිපිකරු හා සමශ්‍රේණි ද, 6.9% ක් කාර්මික නිලධාරීන් ද, 52.8% ක් කණිෂ්ඨ සේවකයින් ද, 29.2% ක් ආරක්ෂක නිලධාරීන් ද හා 2.1% ක් රියදුරන් ද වේ. රුහුණ විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අංශ සේවකයින් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම අනෙක් අංශවලට වඩා සාපේක්ෂව වැඩිය. ඔවුන්ට සතියකට දින 06 ක් සේවය කිරීමට සිදුවීම හා සේවා මුර බෙදී ඇති ආකාරයද වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම කෙරෙහි යම් බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇත.


**ප්‍රස්තාර අංක 04**
**ස්ත්‍රී පුරුෂ භාවය හා නිවාඩු**




මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු (2000 - 2005)


වර්ෂ 05 තුළම නිවාඩු ලබාගෙන ඇති සේවකයින්ගෙන් 87% ක් පුරුෂ පක්ෂය ද, 13% ක් ස්ත්‍රී පක්ෂය ද විය.

ප්‍රස්තාර අංක 05
පීඨ අනුව නිවාඩු ලබා ගැනීම




මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු (2000 - 2005)

ප්‍රස්තාර අංක 6
ඒ ඒ වර්ෂයන්හි ලබාගත් වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය අනුව




මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු (2000 - 2005)

### වගු අංක 1

### 2000 - 2005 වර්ෂයන්හි ලබා ගත් වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය අනුව


| වර්ෂය | වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | <10 | 11-20 | 21-30 | 31-40 | 41-50 | 51-60 | 61-70 | 71-80 | 81-90 | 91-100 | >100 |
| 2000 | 35 | 21 | 5 | | | | | | 1 | 1 | |
| 2001 | 37 | 9 | 3 | 3 | | 1 | | | | | 1 |
| 2002 | 44 | 10 | 8 | 3 | 3 | 1 | | | | | |
| 2003 | 26 | 9 | 8 | 8 | 6 | | | | | | |
| 2004 | 23 | 7 | 7 | 2 | | 2 | 1 | 1 | | 1 | |
| 2005 | 11 | 12 | 5 | 3 | 2 | 3 | | | | | |
| | 176 | 68 | 36 | 19 | 11 | 7 | 1 | 1 | 1 | 2 | 1 |

මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු (2000 - 2005)

විශ්වවිද්‍යාල පද්ධතිය තුල ආසන්න වර්ෂ 03 ක (2003, 2004, 2005) වැටුප් රහිත නිවාඩු අධ්‍යනය කිරීම සඳහා සබරගමුව, කැළණිය, කොළඹ, ජයවර්ධනපුර සහ මොරටුව යන විශ්වවිද්‍යාල වලින් ගෙන්වා ගන්නා ලද සංඛ්‍යාලේඛණවලින් අධ්‍යනයට අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදි. එහිදී අඩුම වැටුප් රහිත නිවාඩු ප්‍රමාණයක් ලබාගන්නා විශ්වවිද්‍යාලය වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයද වැඩිම වැටුප් රහිත නිවාඩු ප්‍රමාණයක් ලබා ගන්නා විශ්වවිද්‍යාලය වශයෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලයද හඳුනා ගත හැකි විය. විශ්වවිද්‍යාල පද්ධතිය තුල වැඩිම වැටුප් රහිත නිවාඩු ලබා ගන්නේ කණිෂ්ඨ සේවකයන්ය. එමෙන්ම සෑම විශ්වවිද්‍යාලයකම ස්ත්‍රී පක්‍ෂයට වඩා පුරුෂ පක්‍ෂය වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා බව දක්නට ලැබේ.

### ප්‍රස්තාර අංක 7

### වයස් කාණ්ඩ අනුව වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයින්ගේ ප්‍රමාණය




මූලාශ්‍රය : ආයතන අනධ්‍යයන අංශයේ ලිපිගොනු (2000 - 2005)

වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයින් වයස් කාණ්ඩ වශයෙන් ගත් කළ අවුරුදු 50-60 අතර කාණ්ඩය 27% ක් ද, 41-50 අතර 39% ක් ද, 31-40 අතර 27% ක් හා අවු. 20-30 අතර 7% ක් ද විය. මෙහිදී අවු.41-50 අතර සේවකයින් වැඩි ප්‍රතිශතයක් වැටුප් රහිත නිවාඩු ලබාගන්නා බව පෙනී ගියේය. අවුරුදු 55-60 කාලයේදී සේවා දීර්ඝ කිරීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සලකා බලන බැවින් බොහෝ සේවකයින් වැටුප් රහිත නිවාඩු නොගෙන සිටීමට උනන්දු වන බව දක්නට ලැබුනි.

| | සබරගමුව වි.වි. | | | කැළණිය වි.වි. | | | කොළඹ වි.වි. | | | ජයවර්ධනපුර වි.වි. | | | මොරටුව | | | රුහුණ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2003 | 2004 | 2005 | 2003 | 2004 | 2005 | 2003 | 2004 | 2005 | 2003 | 2004 | 2005 | 2003 | 2004 | 2005 | 2003 | 2004 | 2005 |
| ස්ථිර අනධ්‍යයන මුළු සේවක සංඛ්‍යාව | 237 | 255 | 254 | 592 | 577 | 643 | 725 | 725 | 727 | 571 | 597 | 587 | 505 | 489 | 493 | 813 | 812 | 797 |
| ලබාගෙන ඇති මුළු වැටුප් රහිත නිවාඩු දින ගණන | 1 | 27 | 109 | 420 | 486 | 267 | 150 | 148 | 148 | 1008 | 1012 | 344 | 667 | 609 | 259 | 995 | 778 | 698 |
| වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය අනුව ප්‍රතිශතය | **0.42** | **10.59** | **42.91** | **70.95** | **84.23** | **41.52** | **20.69** | **20.41** | **20.36** | **176.53** | **169.51** | **58.60** | **132.08** | **124.54** | **52.54** | **122.39** | **95.81** | **87.58** |
| වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව | 1 | 4 | 10 | 33 | 30 | 20 | 15 | 9 | 10 | 65 | 77 | 43 | 52 | 27 | 18 | 57 | 44 | 36 |
| සේවක සංඛ්‍යාව අනුව ප්‍රතිශතය | **0.42** | **1.57** | **3.94** | **5.57** | **5.20** | **3.11** | **2.07** | **1.24** | **1.38** | **11.38** | **12.90** | **7.33** | **10.30** | **5.52** | **3.65** | **7.01** | **5.42** | **4.52** |
| වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව (කාණ්ඩ වශයෙන්) | | | | | | | | | | | | | | | | | | |
| දින 100 ට වැඩි | | | | | | | | | | | | | | | | | | |
| දින 75-100 අතර | - | - | - | - | - | 1 | - | - | - | 1 | - | - | | | | | - | - |
| දින 50-75 අතර | - | - | - | - | 1 | 1 | - | 2 | 2 | 2 | - | - | | - | - | | 1 | |
| දින 25-50 අතර | - | - | 1 | 2 | 1 | - | 2 | 3 | 3 | 3 | 4 | 1 | 1 | 2 | | | 4 | 3 |
| දින 25 ට අඩු | - | - | - | 3 | 8 | 1 | 3 | 1 | 4 | 7 | 8 | 1 | 9 | 12 | 4 | 22 | 9 | 10 |
| | 1 | 4 | 9 | 28 | 20 | 17 | 10 | 3 | 1 | 52 | 65 | 41 | 42 | 13 | 14 | 35 | 30 | 23 |
| වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව (තනතුර අනුව) | | | | | | | | | | | | | | | | | | |
| ලිපිකරු හා සමශ්‍රේණි | | | | | | | | | | | | | | | | | | |
| කාර්මික නිලධාරී | - | - | - | 7 | 4 | 4 | - | 1 | 1 | 9 | 21 | 9 | 2 | 2 | | 2 | 0 | 1 |
| කණිෂ්ඨ සේවක | - | - | 1 | 2 | 1 | - | - | 1 | 2 | 6 | 8 | - | 3 | 1 | - | 4 | 2 | 2 |
| ආරක්ෂක සේවක | 1 | 3 | 9 | 22 | 20 | 5 | 15 | 7 | 7 | 39 | 44 | 33 | 46 | 24 | 18 | 34 | 26 | 19 |
| රියදුරු | - | - | - | 2 | 5 | 9 | - | - | - | 8 | 2 | 1 | | | | 17 | 14 | 13 |
| | - | 1 | - | - | - | 2 | - | - | - | 3 | 2 | - | 1 | | - | 1 | 1 | 1 |
| වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) | | | | | | | | | | | | | | | | | | |
| ස්ත්‍රී | | | | | | | | | | | | | | | | | | |
| පුරුෂ | - | 1 | 1 | 3 | 6 | 4 | - | 1 | 2 | 14 | 15 | 8 | 2 | 1 | 0 | 4 | 2 | 2 |
| | 1 | 3 | 9 | 33 | 24 | 16 | 15 | 8 | 8 | 51 | 62 | 35 | 50 | 26 | 18 | 53 | 42 | 34 |

වගු අංක 2

**නිගමන**

අධ්‍යයනයෙන් හෙලි වූ පරිදි භවතුන් වැටුප් රහිත නිවාඩු වැඩිපුර ලබා ගැනීමට බලපා ඇති හේතු ගණනාවක් වේ.

1. තමාගේ හෝ පවුලේ සාමාජිකයින්ගේ සෞඛ්‍ය ගැටළු හේතුවෙන් වැටුප් රහිත ලබා ගැනීම මෙම ප්‍රවර්තනයට අයත් පිරිස 57% විය.
2. පවුල් පරිසරය තුල ඇති වන ගැටළු කාරී තත්වයන් හේතුවෙන් නිවාඩු ලබා ගැනීම මෙම පිරිස සමස්ත නියදියෙන් 5% විය.
3. රැකියා ස්ථානයට ඇති නොකැමැත්ත. ඔවුන්ගේ ප්‍රමාණය සමස්ත නියැදියෙන් 2% විය.
4. රැකියා ස්ථානයට ඇති දුර නිසා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම. මෙම කාණ්ඩයට අයත් පිරිස 1% විය.
5. අතිරේක මුදල් ඉපයීමේ කාර්‍යයන්හි නිරත විම. 29% ප්‍රමාණයක් මෙම කාණ්ඩයට අයත් විය.
6. ප්‍රමාද වී සේවයට පැමිණීම හේතුවෙන් නිවාඩු අඩු කිරීමට ලක් වීම. ඔවුන්ගේ ප්‍රමාණය 5% මණි. (නියමිත වේලාවට පසුව සේවයට වාර්තා කිරීම නිවාඩු වලින් හිලව් කරයි.)
7. පූර්ව අනුමැතියෙන් තොරව නිවාඩු ලබා ගැනීම. මෙම පරිසි 1% පමණ විය.

**යෝජනා**

සේවකයින් වැටුප් රහිත නිවාඩු ගැනීම පාලනය කිරීම සඳහා පහත සඳහන් යෝජනා සලකා බැලීම වැදගත් වේ.

1. විශ්වවිද්‍යාල කාර්‍ය මණ්ඩලය තුළ විවිධ බුද්ධි මට්ටම්වල සේවකයින් සිටින බැවින් ඔවුන්ට තමාගේ රැකියාවේ වැදගත්කම, නිවාඩු ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග එනම් පූර්ව අනුමැතිය ඇතිව නිවාඩු ලබාගත යුතු බව හා නියමිත ආකාරයට නිවාඩු ලේඛනයේ ඒ බව සටහන් කිරීම ආදිය පිළිබඳව අවබෝධයක් ලබාදීම. මෙය ආයතනික චක්‍රලේඛ මගින් හෝ වැඩමුළු පැවැත්වීම මගින් සිදු කළ හැක.
2. සේවකයන් නිවාඩු ලබා ගෙන ඇති අයුරු ප්‍රස්ථාරිකව ඒ ඒ අංශවල ප්‍රදර්ශනය කිරීම.
3. සේවකයන් නිවාඩු 45 ආසන්න වන විට අංශ ප්‍රධාන හරහා ඔවුන්වෙත දන්වා යැවීම.
4. යම් සේවකයෙකු වැඩිපුර නිවාඩු ලබාගන්නා බව එම අංශ ප්‍රධානියාට පෙනී යන විට ඔහුගේ/ඇයගේ නිවාඩු අවසන් වන තුරු නොසිට එම සේවක භවතාගෙන් ඒ පිළිබඳව විමසා යම් ගැටළුවක් ඇත්නම් එය විසඳීමට කටයුතු කිරීම.
5. වැටුප් රහිත නිවාඩු ලබාගන්නා සේවකයින්ගේ වැටුප් වර්ධක නතර කරන අයුරින්ම නිවාඩු අඩුවෙන් ලබාගන්නා සේවකයින් යම් ඇගයීමකට ලක් කිරීම.
6. නියමිත වේලාවට රාජකාරියට වාර්තා කිරීමට සේවකයින් උනන්දු කරවිම. මෙහිදී පැමිණීමේ ලේඛනය අත්සන් කිරීම පමණක් නොව අංශ ප්‍රධානීන් තම සේවකයින් පුරුද්දක් ලෙස නියමිත වේලාවට රාජකාරියට පැමිණෙන ලෙස ඔවුන් දැනුවත් කිරීම.
7. වැඩි අතිකාල පැය ගණනක් සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව සලසා දීම සඳහා නිවාඩු ලබා ගන්නා සේවකයින් වෙත්නම් එම අංශ ප්‍රධානීන් ඒවා නිරීක්ෂණය කොට එම ස්වා වැඩමුරයන් නිසි ආකාරයට සකස් කිරීම.
8. සේවකයින් සේවයට නොපැමිණීමේදී නිවාඩු ලේඛනයේ විධිමත් අයුරින් සටහන් කිරීමට උපදෙස් ලබාදීම හා ඒවා විධිමත් අයුරින් ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීම.
9. සෑම අවුරුද්දකම වැඩිපුර වැටුප් රහිත නිවාඩු ලබාගන්නා සේවකයින් වර්ෂයකට වරක් හෝ ඔවුන්ගේ අංශ ප්‍රධානීන් සමග සාකච්ඡාවකට කැඳවා ඔවුන්ට යම් අවවාදාත්මක දේශනයක් හා රැකියාවේ වගකීම පිළිබඳව අවබෝධයක් ලබාදීම.
10. සමහර සේවකයින් තමන්ට හිමි වාර්ෂික, විවේක හා අනියම් නිවාඩු අවසන් වී තිබියදීත් ඉන්පසු ලබාගන්නා නිවාඩු සඳහා ද අංශ ප්‍රධානීන් ලවා අනුමැතිය ලබාගෙන නිවාඩු අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථා ද ඇති බව පෙනී ගොස් ඇත. එහෙයින් නිවාඩු ලබා ගැනීමේදී නිවාඩු ලේඛනය පිළිබඳ අවධානය යොමු කොට නියමිත නිවාඩු ප්‍රමාණය නොඉක්මවන සේ නිවාඩු අනුමත කිරීමට පියවර ගත යුතුය.
11. නඩත්තු අංශය වැනි ස්ථාන වල දීර්ඝ කාලීනව සේවය කරන සේවකයින් වෙනත් ස්ථානවලට මාරු කිරීම හා නිවස ආසන්න පීඨවලට සුදුසු අයුරින් ස්ථාන මාරුවීම් ක්‍රමයක් ලබාදීම.

**පරිශීලනය කරන ලද තොරතුරු මූලාශ්‍ර**

1. රුහුණ විශ්වවිද්‍යාලයේ අනධ්‍යන ආයතන අංශයේ 2000 - 2005 නිවාඩු ලිපිගොනුව.
2. වාර්ෂික වාර්තා.
3. වෙනත් විශ්වවිද්‍යාලවලින් ගෙන්වා ගන්නා ලද සංඛ්‍යා ලේඛන.